# 3 ශ්‍රේණිය

# මූලික පිරිවෙන්

# පාලි භාෂාව

## මධ්‍ය හා අවසන් වාර ප්‍රශ්න පත්‍ර

## Mid Term and Year End Papers


**මූලික පිරිවෙන් මධ්‍ය හා අවසාන වාර ප්‍රශ්න පත්‍ර i-ii**



මූලික පිරිවෙන් පාලි භාෂාව මධ්‍ය වාර හා අවසන් වාර පසුගිය ප්‍රශ්න පත්‍ර

# පාලි

## මධ්‍ය වාර ප්‍රශ්න පත්‍ර - 3 ශ්‍රේණිය



# මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2018

## Primary Piriven Mid Term Test - 2018

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

03 වසර / Grade 03

පාලි
**PALI**

කාලය : පැය තුන යි
Time : Three Hours

**I** කොටසට ද, **II** කොටසින් 02, 03 ප්‍රශ්න ද ඇතුළත් වන පරිදි ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

### I කොටස

**01.** කෙටි පිළිතුරු සපයන්න.

i. අඝෝෂ අක්ෂර ලියා දක්වා ඒවා අඝෝෂ නමින් හැඳින්වීමට හේතු දක්වන්න.
ii. ක, ච, ප, ධ යන අක්ෂරවලින් ආරම්භ වන පාලි වචන 2 බැගින් ලියා දක්වන්න.
iii. පඨමා, ආලපන, දුතියා, තතියා යන විභක්ති යෙදෙන ප්‍රධාන අර්ථ ලියා දක්වන්න.
iv. අඤ්ඤ, අපර, ඉම, අඤ්ඤතර යන සර්වනාම පදවල අර්ථ ලියන්න.
v. පාලි භාෂාවේ ආඛ්‍යාත විභක්ති 08 නම් කරන්න.
vi. කමටහන් හතර නම් කරන්න.
vii. ආතුරො, කලන්දකො, අඞ්ගුලිං, දහරො, අඞ්කුසං, බිලං, දාසො, ආතුරාලයං යන වචන අකාරාදි පිළිවෙළට සකසා ලියන්න.
viii. '**ඉමං ගඞ්ගා පන අස්සමා පුරතො සන්දති.**' යන වාක්‍යය නිවැරදි ව ලියා දක්වන්න.
ix. උකාරාන්ත සත්‍ථු ශබ්දය හා සමාන ව වරනැගෙන ශබ්ද 4ක් නම් කරන්න.
x. ආගතකාලෙ, අවසෙසං, ආසිවිසෙන, නිබ්බිසො යන වචනවල තේරුම් ලියා දක්වන්න.

*(ලකුණු 04 x 10 = 40 යි)*

### II කොටස

**02.** (අ) පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

එකා මහාගාමවාසී උපාසිකා රාජමහාවිහාරෙ **මණිචෙතියගෙහද්වාරෙ** ධම්මං සුණමානා අත්තනා පත්‍ථෙත්වා ලද්ධං එකපුත්තකං ආසිවිසෙන ඩසන්තං දිස්වා **ධම්මසවණස්ස** අන්තරායං මා හොතූ'ති වත්වා සයඤ්ච න නිවාරෙසි, අඤ්ඤෙසඤ්ච න දස්සෙසි.

*(ලකුණු 05 යි)*

(ආ) පහත සඳහන් වාක්‍ය සිංහලට නගන්න.

i. සො පීඨෙ නිසීදති.
ii. හත්‍ථිපාලකො ගජං විනෙති.
iii. මාතා පුත්තං ලාලෙති.
iv. වනිතායො පදුමානි ආහරිංසු.
v. කාලකතා සා කුහිං නිබ්බත්ති?

*(ලකුණු 05 යි)*

(ඉ) පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න.

i. මව මනසින් මෙසේ සිතුවාය.
ii. ගොපල්ලා ගොනුන් විකුණයි.
iii. සොරු මිනිසුන්ගේ අශ්වයන් සොරකම් කළහ.
iv. ඇත්ත කියන්නා ජයගනී.
v. හෙතෙම මේ ධනය දී සැප ලබන්නේය.

*(ලකුණු 05 යි)*

03. (අ) පහත සඳහන් ඡේදය සිංහලයට නගන්න.

සො කිර බ්‍රහ්මලොකා චුතසත්තො සාවත්ථියං මහාභොගකුලෙ නිබ්බත්තො ජාතදිවසතො පට්ඨාය ඉත්ථිසමීපං උපගන්තුං න ඉච්ඡති. ඉත්ථියා ගය්හමානෙ රොදතී'ති වත්ථචුම්බටකෙන නං ගහෙත්වා ථඤ්ඤං පායෙන්ති. සො වයප්පත්තෙ මාතාපිතූහි තාත, ආවහං තෙ කරිස්සාමා'ති වුත්තො න මෙ ඉත්ථියා අත්ථො'ති පටික්ඛිපිත්වා පුනප්පුනං යාචියමානො පඤ්චසතෙ සුවණ්ණකාරකෙ පක්කොසාපෙත්වා .................

*(ලකුණු 08 යි)*

(ආ) කාමයන්ගේ ආදීනව පිළිබඳ අනිත්ථිගන්ධකුමාරයාගේ කථාව ඇසුරින් සාකච්ඡා කරන්න.

*(ලකුණු 07 යි)*

04. (අ) මනොගණික ශබ්ද යනු මොනවා ද? එම ගණයට අයත් නාම 2ක් නම් කරන්න.

(ආ) සර්වනාම යනු මොනවා දැයි හඳුන්වා ඒවා භාෂාවේ යෙදෙන ආකාරය පෙන්වා දෙන්න.

(ඉ) උකාරාන්ත පුල්ලිඞ්ග නත්තු ශබ්දය හෝ අකාරාන්ත නපුංසකලිඞ්ග තප ශබ්දය සියලු විභක්තිවල වරනගා වගු ගතකර දක්වන්න.

*(ලකුණු 03 + 06 + 06 = 15 යි)*

05. (අ) ආඛ්‍යාත විභක්ති තුනක් නම් කරන්න.

(ආ) සත්තමී ආඛ්‍යාතය හඳුන්වා උදාහරණ 2ක් ලියා දක්වන්න.

(ඉ) √ගමු ධාතුව හෝ √භූ ධාතුව හෝ සත්තමී ආඛ්‍යාත උභය පදයේ වරනගා වගු ගතකර දක්වන්න.

*(ලකුණු 03 + 06 + 06 = 15 යි)*

06. (අ) පහත සඳහන් වාක්‍ය සුදුසු කර්ම පද යොදා සම්පූර්ණ කරන්න.

I. ත්වං.................ගච්ඡාහි.
II. භික්ඛවො............රක්ඛන්ති.
III. හත්ථිනො.................ඛාදන්ති.
IV. දාසා .................ආහරන්ති.
V. මයං .................කසාම.
VI. තුම්හෙ .................ආරුහථ.
VII. කම්මකාරො ................. කරොති.
VIII. බුද්ධො .................දෙසෙති.
IX. අහං .................සමාදියාමි.
X. මාතා .................ලාලයති.

(ආ) පහත සඳහන් වාක්‍ය බහුවචනයට හරවා නැවත ලියන්න.

I. කාකො රවති.
II. ත්වං සයසි.
III. සච්චවාදී සච්චං භණති.
IV. කස්සකො ඛෙත්තං කසති.
V. සමණො උපස්සමෙ නිසීදති.

*(ලකුණු 10 + 05 = 15 යි)*

***

# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2019

## Primary Piriven Mid Term Test - 2019

### 03 ශ්‍රේණිය / Grade 03

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved)

**පාලි** කාලය : පැය තුනයි

**PALI** Time : Three Hour

❖ **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

---

01. කෙටි පිළිතුරු සපයන්න.

i. අන්තස්ථාක්ෂර ලියා දක්වන්න.
ii. **මහාසයො** යන්නෙහි අකුරු අකාරාදි පිළිවෙළට සකසන්න.
iii. චතුත්‍ථී හා පඤ්චමී යන විභක්තිවල ප්‍රධාන අර්ථ දෙක ලියන්න.
iv. **සත්ථු** යන්නෙහි බහුවචන පදය ලියන්න.
v. මනොගණික ශබ්ද හතරක් ලියන්න.
vi. බාලකො මාතා යන පද දෙකට යෙදිය හැකි සර්වනාම පද දෙකක් ලියන්න.
vii. අතීත කාලයට අයත් ආඛ්‍යාත විභක්ති දෙකක් ලියන්න.
viii. සත්තමී ආඛ්‍යාත විභක්තිය යෙදෙන අර්ථ දෙක ලියන්න.
ix. "**අස්සූනි පග්ඝරන්ති**" යන්න සිංහලයට නගන්න.
x. **දරිකා මග්ගෙ ධාවි.** මෙම වාක්‍ය අනාගත කාලයෙන් ලියන්න.

(ලකුණු 02 x 10 = 20)

02. පහත දැක්වෙන ඡේදය සිංහලට නගන්න.

සත්ථා කින්නු ඛො කුමාර බලවසොකො තෙ උප්පන්නොති වුත්තෙ, ආම භන්තෙ එවරූපා නාම ඉත්ථී අන්තරාමග්ගෙ කාලකතාති සුත්වා බලවසොකො මෙ උප්පන්නො, භත්තම්පි මෙ නච්ඡාදෙතීති. අථ තං සත්ථා ජානාසි පන ත්වං කුමාර කිං තෙ නිස්සාය සොකො උප්පන්නොති? න ජානාමි භන්තෙ'ති.

(ලකුණු 10)

03. පහත දැක්වෙන වාක්‍ය පාලියට නගන්න.

i. බුදුරජ භික්ෂූන්ට ධර්මය දේශනා කළේය.
ii. ගොපල්ලා ගොනුන් විකුණයි.
iii. අපි අනුරාධපුරයට යන්නෙමු.
iv. රජතුමා රට පාලනය කරයි.
v. වැද්දා මුවෙකු මරයි.

(ලකුණු 02 x 05 = 10)

04. (අ) පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| නාම පදය | විභක්තිය | වචනය | අර්ථය |
|---|---|---|---|
| සත්ථරි | ............................... | ............................... | ............................... |
| මනසො | ............................... | ............................... | ............................... |
| මාතරෙ | ............................... | ............................... | ............................... |
| පිතුනො | ............................... | ............................... | ............................... |
| සත්ථාරානං | ............................... | ............................... | ............................... |

(ලකුණු 1 x 15 = 15)

(ආ) පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| ආඛ්‍යාත පදය | අඛ්‍යාත විභක්තිය | පුරුෂය | වචනය |
|---|---|---|---|
| ජාලෙසි | අජ්ජතනී | ............................... | ............................... |
| ආරුහිං | ............................... | ............................... | ඒකවචන |
| ජයාහි | ............................... | මජ්ඣිම පුරිස | ............................... |
| චරිස්සසි | භවිස්සන්ති | ............................... | ............................... |
| රක්ඛන්තු | ............................... | පඨම පුරිස | ............................... |

(ලකුණු 1/2 x 10 = 05)

05. (අ) ලෝපය, ආදේශය, ආගමය, ද්විත්වය, දීර්ඝය යන සන්ධි විධිවලට උදාහරණය බැගින් ලියන්න. (ව්‍යාකරණ විධිය සිදු වූ අයුරු පෙන්වා දී තිබිය යුතුය)

(ආ) පහත දැක්වෙන විසන්ධි පද සන්ධි කර ලියන්න.

i. නගරෙ + එව    ii. සෙට්ඨී + ඨානං    iii. අහං + එව
iv. ආකාසෙ + එව    v. දුක්ඛ + පත්තො

(ඉ) පහත දැක්වෙන වචනවල සිංහල තේරුම ලියන්න.

i. කච්චි
ii. කීව
iii. සෙය්‍යථාපි
iv. අභිණ්හං
v. සහසා

(ලකුණු 5 + 5 + 5 = 15)

06. පහත දැක්වෙන ගාථා හා පාඨ සම්පූර්ණ කරන්න.

i. සවාසනෙ කිලෙසෙ සො .........................

ii. තථා ඉත්ථිපුමාචෙව ..............................

iii. අවිඤ්ඤාතා සුහනිහං ..............................

iv. මහා සම්පත්ති සම්පත්තා ......................

v. ඣවාසවණ්ණං ලුත්තෙ ............................. නොපෙති.

(ලකුණු 02 x 05 = 10)

07. (අ) අකාරාන්ත සර්වනාම අම්හ ශබ්දය සියලු විභක්තිවල වගුගත කොට වරනගා දක්වන්න.

(ආ) හර ධාතුව සත්තමී ආඛ්‍යාත විභක්ති පරස්සපදයේ වගුගත කොට වරනගා දක්වන්න.

(ලකුණු 08 + 07 = 15)

***

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமை உடையது]
All rights reserved]

**අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**
கல்வி அமைச்சு - சிறப்புக் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**මධ්‍යවාර පරීක්ෂණය - 2022**
**இடைக்காலம் பரீட்சை- 2022**
**Mid Year Term Test - 2022**

පැය තුනයි

**පාලි** විභාග අංකය : ........................................... **3 ශ්‍රේණිය**

❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**1. කෙටි පිළිතුරු සපයන්න.**

i. '**තපොධනතා සරා අටඨ**' මේ පාඨයේ සරල අර්ථය ලියා දක්වන්න.

ii. '**ධනිතාක්ෂර** හා **සිථිලාක්ෂර**' ගණනින් කෙතෙක්ද ?

iii. '**සම්ප්‍රදානාර්ථය** හා **ආධාරාර්ථය**' දෙන නාම විභක්ති දෙක නම් කරන්න.

iv. '**සත්‍ථු**' ශබ්දය අනුව වරනැගෙන තවත් ශබ්ද 2ක් නම් කරන්න.

v. **ඉත්‍ථිලිංග** ශබ්ද දෙකක් නම් කරන්න.

vi. **සර්ව නාම** පද 2ක් ලියන්න.

vii. ආඛ්‍යාත විභක්ති ගණනින් කෙතෙක් ද ?

viii. '**පඤ්චමී ආඛ්‍යාත විභක්තියේ** ' අර්ථ දෙක නම් කරන්න.

ix. **"වග්ගා පඤ්ච පඤ්චසො මන්තා"** යන සූත්‍රයෙන් හඳුන්වන අක්ෂර ප්‍රභේදය නම් කරන්න.

x. '**ස , ළ**' යන අක්ෂර දෙකට අදාළ ප්‍රභේද දෙක නම් කරන්න. (ලකුණු 2 x 10 = 20 යි. )

**2. පහත දැක්වෙන පාලි ඡේදය සිංහලට පරිවර්තනය කරන්න.**

අහම්පි සස්ස නිප්ඵන්නෙ තුම්හාකං සංවිභාගං කරිස්සාමී'ති අවචං, සො මෙ මනොරථො න නිප්ඵන්නො තෙන මෙ සොකො උප්පන්නො භත්තම්පි මෙ නච්ඡාදෙතී'ති, අථ නං සත්‍ථා ජානාසි පන ත්වං බ්‍රාහ්මණ කිං තෙ නිස්සාය සොකො උප්පන්නො'ති පුච්ඡිත්වා න ජානාමි භො ගොතම, ත්වං පන ජානාසී'ති වුත්තෙ ආම බ්‍රාහ්මණ උප්පජ්ජමානො හි සොකො වා භයං වා තණ්හං නිස්සාය උප්පජ්ජතී'ති වත්වා ඉමං ගාථමාහ.

**තණ්හාය ජායතී සොකො - තණ්හාය ජායතී භයං,**
**තණ්හාය විප්පමුත්තස්ස - නත්‍ථි සොකො කුතො භයං"ති.**

(ලකුණු 20යි. )

3. (අ) පහත වාක්‍ය සිංහලට නගන්න.

i. මාතා පුත්තං ලාලෙති.

ii. දාරකො ඡත්තං ගණ්හිතුං සොපාණං ආරුහති.

iii. රාජා භවතු ධම්මිකො.

iv. සබ්බෙ පාණිනො ච රුක්ඛලතායො ච ජලෙන ජීවන්ති.

v. ජනකා පුත්තං ඔවදන්ති. (ලකුණු 2 x 5 = 10 යි. )

(ආ) පහත වාක්‍ය පාලියට නගන්න.

i. පුරුෂයා කුඹුරට යයි.

ii. භික්ෂුව විහාරයෙහි වාසය කළේය.

iii. පියවරු පුතුන්ට අවවාද දෙන්නෝය.

iv. ශිෂ්‍යයා පිරිවෙනට යන්නේ නම් මැනවි.

v. රජු දැහැමි වේවා. (ලකුණු 2 x 5 = 10 යි. )

4. (අ) පහත දැක්වෙන නාමපදවල විභක්තිය, වචනය හා එය අයත්වෙන අන්තය නම් කරන්න.

i. පිතරෙ

ii. මනසමා

iii. තුම්හෙසු

iv. අග්ගිම්හි

v. මාතරං (ලකුණු 3 x 5 = 15 යි. )

(ආ) වද (කියයි) ධාතුව වර්තමානයේ හෝ අතීතයේ උභය පදයෙහි වරනගා ලියන්න. (ලකුණු 10 යි. )

5. පහත ගාථා සම්පූර්ණ කරන්න.

i. සුඛී භවෙය්‍යං නිද්දුක්ඛො...........

ii. පවාතදීපතුල්‍යාය...........

iii. උප්පත්තියා සහෙ'වෙදං...........

iv. සබ්බකාලගතෙ ධම්මෙ...........

v. වණ්ණසණ්ඨානගන්ධෙහි.......... (ලකුණු 3 x 5 = 15 යි. )

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமை உடையது]
All rights reserved]

**අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**

கல்வி அமைச்சு - சிறப்புக் கல்விப் பிரிவு

Ministry of Education – Division of Piriven Education

**මධ්‍යවාර පරීක්ෂණය - 2023**

**இடைக்காலம் பரீட்சை- 2023**

**Mid Year Term Test - 2023**

පැය තුනයි

**පාලි** විභාග අංකය : ........................................... **3 ශ්‍රේණිය**

❖ **පළමු කොටසටත් දෙවන කොටසේ 2,3 ප්‍රශ්නත් ඇතුළත් වන සේ ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

## i කොටස.

01. **කෙටි පිළිතුරු සපයන්න.**

I. වර නොනැඟෙන පද වර්ගය නම් කර එම පද තුනක් ලියන්න.

II. **ඉතරෙ සිරීලා** යන සූත්‍රයට අදාළ අක්ෂර පිළිවෙළින් ලියන්න.

III. උක්ත කර්තෘ හා අනුක්ත කර්තෘ යෙදෙන විභක්ති නම් කරන්න.

IV. සර්ව නාම ශබ්ද හතරක් නම් කරන්න.

V. අනුමති පරිකල්පාර්ථය - අණකිරීම හා ආශිර්වාදය ප්‍රකාශ කරන ආඛ්‍යාත විභක්ති නම් කරන්න.

VI. **ධාතුවත්ථං බාධකෙ කොචි** යන ගාථාව සම්පූර්ණ කරන්න.

VII. **මාතා පුත්තස්ස ආහාරං දදිස්සති.** යන වාක්‍ය සිංහලට නගන්න.

VIII. සත්තමී ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍ය ලියන්න.

IX. බුදුන් වහන්සේ වසල සූත්‍රය දේශනා කළේ කා හටද? ඉන් වසල කරන ධර්ම තුනක් ලියන්න.

X. රක්ඛන්තු, රුරොද, යන්නූන, පපච යන පදවල තේරුම් ලියන්න.

(ලකුණු 4 × 10 = 40)

## ii කොටස.

02. (අ) පහත සඳහන් වාක්‍ය සිංහලට නගන්න.

i. තෙ බ්‍රාහ්මණෙහි සද්ධිං කතපටිසම්මොදනා ධීතරං ඔතාරෙත්වා හෙට්ඨපාසාදෙ සුවණ්ණරූපකස්ස සන්තිකෙ ඨපෙසුං.

ii. බ්‍රාහ්මණො පාතො'ව ඛෙත්තං ඔලොකෙස්සාමී'ති ගතො' තුච්ඡං ඛෙත්තං දිස්වා උප්පන්න-බලවසොකො චින්තෙසි, සමණො ගොතමො මම ඛෙත්තසොධනකාලතො පට්ඨාය ආගතො අහම්පි තං ඉමස්මිං සස්සෙ නිප්ඵන්නෙ තුය්හම්පි සංවිභාගං කරිස්සාමි. තුය්හං අදත්වා සයං න ඛාදිස්සාමි. ඉතො පට්ඨායදානි ත්වං මම සහායො'ති අවචං සො'පි මෙ මනොරථො මත්ථකං න පාපුණී'ති. ආහාරූපච්ඡෙදං කත්වා මඤ්චකෙ නිපජ්ජි. අථස්ස සත්ථා ගෙහද්වාරං අගමාසි.

(ආ) පහත ගාථා සම්පූර්ණ කරන්න.

I. අවිඤ්ඤාණසුභනිභං...................

II. වණ්ණසණ්ඨාන ගන්ධෙහි .................

III. පතිතම්හාපි කුණපා ................

(ලකුණු 3 + 6 + 6 = 15)

03. (අ) පහත ඡේදය සිංහලට නගන්න.

එකදා එකස්ස වුද්ධසසකස්ස වාරො සම්පාපුණි. සො කථං මරණම්හා මුඤ්චිස්සාමී'ති උපායං චින්තෙන්තො තත්‍ථ තත්‍ථ විලම්බන්තො කාලක්ඛෙපං කත්‍වා තමුපාගමි. බුදාභිභූතත්තා කොපාවිට්ඨො සීහො කස්මා ත්‍වං චිරායිත්‍වා ආගච්ඡසී'ති පුච්ඡි. සාමී, න මය්හං දොසො; අන්තරාමග්ගෙ අඤ්ඤෙන සීහෙනාහං නිවත්තාපිතො'ම්හි.

(ලකුණු 05)

(ආ) පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න.

I. පෙර අනුරාධපුර නම් නගරයක් විය.

II. ඔවුහු ඊයේ උදෑසනම කුඹුරට ගියහ.

III. මගේ බල්ලා මා සමඟ ගමට යයි.

IV. අපි ගමෙන් ගමට නගරයෙන් නගරයට යමු.

V ඔබට ජය මංගල්‍යයක් වේවා.

(ලකුණු 05)

(ඉ) පහත සඳහන් වාක්‍ය සිංහලට

නගන්න.

I. මයං සුවෙ අනුරාධපුරං ගමිස්සාම.

II. දෙවා වසුධායං මනුස්සෙ රක්ඛන්ති.

III. අහං සතතං තුම්හෙ රක්ඛාමි.

IV. එවං සො අත්තනො පවත්තිං කථෙසි.

V. රථස්ස චක්කානි සමං පරිවත්තන්ති.

(ලකුණු 05)

04. (අ) ආඛ්‍යාත විභක්ති කීයද? ඉන් ප්‍රධාන කාල තුනට අයත් ආඛ්‍යාත විභක්ති ලියා දක්වන්න.

(ආ) පහත සඳහන් වාක්‍ය සුදුසු කර්ම පද යොදා සම්පූර්ණ කරන්න.

I. භික්ඛවො ...................... රක්ඛන්ති.

II. මයං ........................... කසාම.

III. මාතා .......................... ලාලයති.

IV. තුම්හෙ ........................ ආරුහථ.

V. කපයො ...................... ඛාදන්ති.

(ඉ) වරහන් තුළ ඇති ආඛ්‍යාත පද සුදුසු හිස්තැනට යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.
(ගච්ඡිස්සන්ති. - අගච්ඡි. - බහුව. - මාරෙථ. - අනුස්සරෙය්‍යාථ.)

I. බාලකා සුවෙ ගාමං ...............................
II. තුම්හෙ ඉමං සප්පං න ...............................
III. අථ ධම්මං ...........................
IV. අතීතෙ ලඞකායං රාවණො නාම රාජා ...............................
V. පිතා පුත්තෙන සද්ධිං ගෙහං ...............................

(ලකුණු 5 + 5 + 5 = 15)

05. (අ) උපසර්ග පද කීයද ? ඉන් 10 ක් ලියන්න ?
(ආ) පහත වරහන් තුළ ඇති නිපාත පද යොදා හිස් තැන් පුරවා නැවත ලියන්න.
(යථා - යත්‍ර - ච - තථා - තත්‍ර - පන - සද්ධිං)

I. සීහා .................. ව්‍යග්ඝා ............... වනෙ වසන්ති.
II. සො අම්හෙහි .................. වාපිං ගමිස්සති.
III. අථ ච ............. පෙතානං.
IV. ථෙරො ............. වදති ............ කරොති.
V. ............. දෙවො න වසති, මයං ............. වසාම.

(ඉ) පහත දී ඇති පදවල උපසර්ග පද වෙන්කොට දක්වන්න.

I. ආගච්ඡත II. පරාජිතො. III.උග්ගණ්හාත IV. අධිවාසනං.
V. නිවාරයති. VI පරිභාසති. VII අනුගච්ඡති. VIII අභිධාවි.
IX අභිවන්‍දත X සුසොභති.

(ලකුණු 5 + 5 + 5 = 15)

06. (අ) පහත සඳහන් වාක්‍ය අතීත කාලයට හරවා ලියන්න.
I. මයං පරිවෙණං ගච්ඡාම.
II. සො ඝටෙන ජලං ආහරති.
III. එකදා තථාගතො තං වනං පවිසති.
IV. පිතා පුත්තෙන සද්ධිං ගෙහං ගච්ඡති.
V. දාරකො ඡත්තං ගණ්හිතුං සොපාණං ආරුහති.

(ආ) පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි පදයේ විභක්ත්‍යර්ථය ලියන්න.
I. හත්‍ථිපාලකො **ගජං** විනෙති.
II. දෙවා **වසුධායං** මනුස්සෙ රක්ඛන්ති.
III. සො **කුසුමෙන** බුද්ධං පූජෙති.
IV. බාලකො **රුක්ඛම්හා** භූමිං පති.
V. චොරා **රඤ්ඤො** අසිං චොරෙසුං.

(ඉ) පහත සඳහන් වාක්‍ය ඒක වචනයට හරවා ලියන්න.

I. වරාහා භූමිං ඛණන්ති.

II. තරුණියො වාපිං ගච්ඡන්ති.

III. ජනකා පුත්තා ඔවදන්ති.

IV. ඉසයො අස්සමෙ නිසීදිංසු.

V. මනුස්සා රුක්ඛං ඡින්දිස්සන්ති.

(ලකුණු 5+ 5 + 5 = 15)


07. (අ) ආඛ්‍යාත පදයක ලක්ෂණ දැක්වෙන ගාථාව ලියා එහි තේරුම ලියන්න.

(ආ) **පච** ධාතුව සත්තමී ආඛ්‍යාත උභය පදයෙහි වරනඟා තේරුම ලියන්න.

(ලකුණු 5 + 10 = 15)

# පාලි

## අවසාන වාර ප්‍රශ්න පත්‍ර - 3 ශ්‍රේණිය



# මූලික පිරිවෙන් අවසාන වාර පරීක්ෂණය - 2018

## Primary Piriven Year End Test - 2018

03 වසර / Grade 03

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**පාලි**
**PALI**

කාලය : පැය තුන යි
Time : Three Hours

**I** කොටසට ද, **II** කොටසින් 02, 03 ප්‍රශ්න ද ඇතුළත් වන පරිදි ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

**I කොටස**

01. කෙටි පිළිතුරු සපයන්න.

i. පාලි වර්ණමාලාවේ ස්වර ප්‍රභේද 2 නම් කර එම ප්‍රභේදවලට අයත් අකුරු ලියා දක්වන්න.
ii. **චතුත්ථී** හා **පඤ්චමී** විභක්ති යෙදෙන අර්ථ 2 ලියා උදාහරණය බැගින් ලියන්න.
iii. **සත්ථු, පිතු, මාතු, මන** යන ශබ්දවල පඨමා විභක්ති බහුවචනය ලියා දක්වන්න.
iv. **බාලකො, මාතා, පුප්ඵං, සත්ථාරො** යන පදවලට සුදුසු සර්වනාම පදය බැගින් ලියන්න.
v. **පිතරා, මයි, තානි, තෙසු** යන පදවල සිංහල තේරුම ලියන්න.
vi. **අනුමති** හා **ආශීර්වාද** අර්ථ යෙදෙන ආඛ්‍යාත විභක්ති නම් කරන්න.
vii. **සදා, සචෙ, සනිකං, කුතො** යන නිපාත පදයන්හි තේරුම ලියන්න.
viii. **ඵලානි පතන්ති** හා **මාතා ඔදනං පචි** යන වාක්‍ය සිංහලට නගන්න.
ix. සන්ධි කිරීම සඳහා යොදගන්නා විධි 4ක් ලියන්න.
x. **ඨඤ්ඤං, පටික්ඛිපිත්වා, අඤ්ඤතරො, නාභාපෙත්වා** යන පදවල තේරුම් ලියන්න.

*(ලකුණු 04 × 10 = 40 යි)*

**II කොටස**

02. (අ) පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

අයං පන තාපසානං අස්සමො. අයං පණ්ණසාලා. අස්මිං අස්සමෙ ජනා සබ්බෙ පසවො ච සකුණා ච සන්තුට්ඨා නිවසන්ති. බහවො රුක්ඛා ඉමස්මිං සන්ති. රුක්ඛා තෙ සාඛාහි විටපෙහි ච සජ්ජිතා. තහිං නිසින්නා පක්ඛිණො නිරන්තරං මධුරං කූජන්ති.

*(ලකුණු 05 යි)*

(ආ) පහත සඳහන් පද සුදුසු පරිදි ගලපා අර්ථවත් වාක්‍ය තනන්න.

i. ආහරිත්වා/සහ/මධුං/පිතරො/භුඤ්ජිංසු/අම්හාකං/දධිනා
ii. දාරුනි/මයං/විනා/ගන්ත්වා/අරඤ්ඤං/භුඤ්ජිස්සාම/තුම්හෙහි
iii. සොපාණං/ ගණ්හිතුං/ආරුහති/ දාරකො/ඡත්තං
iv. පස්සිත්වා/ලභාම/මයං/රූපානි/ලොචනෙහි/ච/දුක්ඛං/ච/සුඛං
v. රක්ඛන්ති/ මනුස්සෙ/වසුධායං/දෙවා

*(ලකුණු 05 යි)*

(ඉ) පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න.

i. මැණියෝ බත පිසූහ.
ii. දැරිය වනයට ගියාය.
iii. මම අකුරක් ලියමි.
iv. කොළ වැටෙයි.
v. අශ්වයෝ මාර්ගයේ දුවත්.

*(ලකුණු 05 යි)*

03. (අ) පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

අථ නං එකදිවසං බ්‍රාහ්මණො ආහ. භො ගොතම ත්වං මම ඛෙත්තසොධනදිවසතො පට්ඨාය ආගතො. සචෙ මෙ සස්සං සම්පජ්ජිස්සති, තුය්හම්පි සංවිභාගං කරිස්සාමි. තුය්හං අදත්වා සයං න ඛාදිස්සාමි. ඉතොදානි පට්ඨාය ත්වං මම සහායොති. අථස්ස අපරෙන සමයෙන සස්සං සම්පජ්ජිතස්ස ''සම්පන්නං මෙ සස්සං ස්වෙදානි දායාපෙස්සාමී''ති දායනත්ථං කත්තබ්බකිච්චස්ස රත්තිං මහාමෙඝො වස්සිත්වා සබ්බසස්සං හරි.

*(ලකුණු 08 යි)*

(ආ) ''තණ්හාය ජායතී සොකො තණ්හාය ජායතී භයං'' යන ගාථා පාඨය යොදාගනිමින් කෙටි අනුසාසනයක් ලියන්න.

*(ලකුණු 07 යි)*

04. (අ) ලෝප, ආදේස, ආගම යන සන්ධි විධි තුනට නිදසුන් තුනක් සපන්න.

(ආ) ස්වර සන්ධියේ අසවර්ණාදේශය හා වකාරාදේශය හඳුන්වා නිදසුන් දෙක බැගින් ලියන්න.

(ඉ) ලොපඤ්ච තත්‍රාකාරො, පරද්වෙභාවො ඨානෙ, ඔ අවස්ස , දීඝං යන සූත්‍ර හඳුන්වා උදාහරණය බැගින් සපයන්න.

*(ලකුණු 03 + 04 + 08 = 15 යි)*

05. (අ) පහත දැක්වෙන පදයන්හි ශබ්ද ප්‍රකෘතිය ලියන්න.

i. මයි ii.ඉමිනා iii.එසො iv. තම්හා v. පිතා vi. මුනිනා

(ආ) චර ධාතුව අජ්ජතනී ආඛ්‍යාත පරස්ස පදයේ වරනගා වගුගත කර දක්වන්න.

(ඉ) සමාස ප්‍රභේද 6 ලියන්න.

*(ලකුණු 03 + 06 + 06 = 15 යි)*

06. (අ) පහත සඳහන් වාක්‍යය දී ඇති සුදුසු නිපාත පද යොදා සම්පූර්ණ කරන්න.

(අභිණ්හං, සචෙ, පුරා, ආරකා, මා, උපරි, තථා, ආවුසො, කුහිං, සහසා)

I. …………….. මං අපාදකො හිංසි.
II. කුමාරි ………. පාසාදෙ තිට්ඨති.
III. …………….. කති වස්සො'සි ත්වං?
IV. යථා මාතා වදති …………….. අහං කරිස්සාමි.
V. සො ……………..අගච්ඡි.
VI. …………….. ත්වං නහායිස්සසි, අහම්පි නහායිස්සාමි.
VII. …………….. තව භාතා?
VIII. ……………..බොධිසත්තො බාරාණසියං උප්පජ්ජි.
IX. පාපමිත්තො ……………..පරිවජ්ජෙය්‍ය.
X. තුම්හෙහි …………….. පච්චවෙක්ඛිතබ්බං.

(ආ) පහත දැක්වෙන වාක්‍ය අතීත කාලයට හරවා ලියන්න.

I. අහං පාඨසාලං ගච්ඡාමි.
II. ත්වං බුද්ධං වන්දසි.
III. වානරො රුක්ඛං ආරුහති.
IV. අධිපති භත්තං භුඤ්ජති.
V. චොරො ඡත්තං චොරෙති.

*(ලකුණු 10 + 05 = 15 යි)*

***

# මූලික පිරිවෙන් අවසාන වාර පරීක්ෂණය - 2019

## Primary Piriven Last Term Test - 2019

### 03 ශ්‍රේණිය / Grade 03

පාලි
PALI

කාලය : පැය තුනයි
Time : Three Hours

I කොටස ද, II කොටසින් 02, 03 ප්‍රශ්නද ඇතුළත් වන පරිදි ප්‍රශ්න **පහකට (05) පමණක් පිළිතුරු** සපයන්න.

## I කොටස

01. කෙටි පිළිතුරු සපයන්න.

- i. පාලි වර්ණ මාලාවේ ඝෝෂ අකුරු හා අඝෝෂ අකුරු වෙන වෙනම ලියා දක්වන්න.
- ii. **පඤ්චමී** හා **සත්තමී** විභක්ති යෙදෙන අර්ථ **දෙකක්** දක්වා උදාහරණය බැගින් ලියා දක්වන්න.
- iii. **මන** ශබ්දය හා සමානව වරනැගෙන ශබ්ද 04ක් ලියන්න.
- iv. **තව, තායො, තානි, මයං** පදවල විභක්තිය ලියන්න.
- v. **අනුමති** හා **පරිකල්ප** යන අර්ථයන්හි යෙදෙන ආඛ්‍යාත විභක්තිය කුමක් ද?
- vi. **පුප්ඵානි විකසන්ති** හා **දාරිකා මග්ගෙ ධාවි** යන වාක්‍ය සිංහලට නගන්න.
- vii. **කත්ථ, යථා, කදා, කුහිං** යන නිපාත පදයන්හි තේරුම ලියන්න.
- viii. පාලි භාෂාවේ බාහිර සන්ධි ප්‍රභේද 04 නම් කරන්න.
- ix. සමාස ප්‍රභේද 04 ක් නම් කරන්න.
- x. තද්ධිතවල ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 4X10 = 40)

## II කොටස

02. (අ) පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

සො කිරෙකො මච්ඡාදිපායිකො එකදිවසං නදීතීරං ගන්ත්වා මෙත්තං **සොවෙති. සත්ථා** තස්ස උපනිස්සයසම්පත්තිං දිස්වා තස්ස සන්තිකං අගමාසි. සො **සත්ථාරං දිස්වා'පි** සාමීචිකම්මං අකත්වා'ව තුණ්හී අහොසි. අථ නං සත්ථා පුරෙතරං ආලපිත්වා **බ්‍රාහ්මණ,** කිං කරොසී'ති ආහ.

(ආ) පහත සඳහන් පද සුදුසු පරිදි ගළපා අර්ථවත් වාක්‍ය තනන්න.

- i. ජලෙන/ ච/ පාණිනො/ ජීවන්ති/ ච/ රුක්ඛලතාදයො/ සබ්බෙ
- ii. මනුස්සෙ/ රක්ඛන්ති/ වසුධායං/ දෙවා
- iii. ඉති/ ඝරාවාසො/ පබ්බජි/ සො/ සම්බාධොයං/ විදිත්වා
- iv. පස්සති/ දාරකො/ ගොණං/ එකං
- v. දත්වා/ තානි/ තස්ස/ අථ/ එවමාහ/ නාගරාජා/ පුප්ඵානි

(ඉ). පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න.

- i. අව පූසා ආහාර දෙන්නා ය.
- ii. ගසෙන් ගෙඩි වැටෙයි.
- iii. අපි යාචකයන්ට ආහාර දුනිමු.
- iv. අශ්වයෝ මාර්ගයේ දුවත්.
- v. ගොපල්ලා ගොනුන් විකුණයි. (ලකුණු 5+5+5 - 15)

03. (අ). පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

තදා එකො සුවපොතකො පිපාසිතො තහං තහං පානීයං පරියෙසන්තො මහාසමුද්දෙ එකස්මිං පූතිපාදපෙ සට්ඨිරතනන්තරකාවාටෙ පානීයගන්ධං ඝායිත්වා ලොභෙන පක්ඛෙ පතිතෙසො අතිපානෙන භාරො තත්ථෙ'ව පතිත්වා උග්ගන්තුං නාසක්ඛි. අථාපරො'පි සප්පො ච, මනුස්සො චාති ද්වෙ ජනා තත්ථෙ'ව පතිංසු. සප්පා නාම විවෙකං ලද්ධා'ව අත්තං විජහන්ති. තස්මායං අලද්ධා විවෙකන්තං උග්ගන්තුං නාසක්ඛි. අනාලම්බත්තා මනුස්සො'පි තෙන උග්ගන්තුං අසක්කොන්තා මරණභයභීතා අඤ්ඤමඤ්ඤං විහෙඨෙන්තා තත්ථෙ'ව වසිංසු.

(ආ). පහත ගාථා සම්පූර්ණ කරන්න.

- i. එතො සබ්බස්ස ලොකස්ස ........................
- ii. සමන්තා චක්කවාළෙසු ........................
- iii. අසුචිසන්දකෙ නිච්චං ........................
- iv. භාවෙත්වා චතුරාරක්ඛා ........................ (ලකුණු 7+8 - 15)

04. (අ) සන්ධි විධි 08 නම් කරන්න.

(ආ) පහත සන්ධි පද විසන්ධි කරන්න.

| | | | |
|---|---|---|---|
| i. | බහූපකාරං | v. | ඉච්චෙවං |
| ii. | ආකාසෙව | vi. | තථාහං |
| iii. | චනිදං | vii. | නිවඩ්ඪිතං |
| iv. | චක්ඛුන්ද්‍රියං | viii. | තස්මාතිහ |

(ඉ) පාලි භාෂාවේ සාමඤ්ඤ තද්ධිත ප්‍රභේද 04 නම් කරන්න.

(ඊ) පහත තද්ධිත පදවල ප්‍රත්‍යය වෙන් කරන්න.

- i. සාකටික
- ii. සත්තම
- iii. වාසිට්ඨ (ලකුණු 4+4+4+3 - 15)

05. (අ) පහත දැක්වෙන පදයන්හි ශබ්ද ප්‍රකෘතිය ලියන්න.

i. ඉමිස්සං
ii. එතිස්සො
iii. තයි
iv. මෙ.
v. මනෙහු
vi. පිතානං

(ආ) ගමු (ගච්ඡති) ධාතුව පංචමී ආඛ්‍යාත පරස්සපදයේ වරනගන්න.

(ඇ) සමාස නම් කරන්න.

i. මහාවීරො
ii. තිභවං
iii. පත්තචීවරං
iv. බුද්ධරූපං
v. ගුණධනං
vi. උපනගරං

(ලකුණු 3+6+6 - 15)

06. (අ). පහත සඳහන් වාක්‍ය දී ඇති සුදුසු නිපාත පද යොදා සම්පූර්ණ කරන්න.

(කථං, කිං, උපරි, මා, කුතො)

i. කුමාරි ............................ පාසාදෙ තිට්ඨති.
ii. ............................ සොචිත්ථ මා පරිදෙවිත්ථ.
iii. තං ............................ හොති?
iv. තුම්හෙ ............................ උදකං ලභථ?
v. උදකත්ථාය මනුස්සා ............................ කරිස්සන්ති?

(ආ). පහත දැක්වෙන වාක්‍ය අතීත කාලයට හරවා ලියන්න.

i. කාකා රවන්ති.
ii. ත්වං සයසි.
iii. සච්චවාදී සච්චං භණති.
iv. අහං ඛෙත්තං කසාමි.
v. වරාහා භූමිං ඛණන්ති.

(ඉ). පහත වාක්‍ය නිවැරදි කොට ලියන්න.

i. මනුස්සා රුක්ඛං ජින්දි.
ii. අයං සීහො එකො ඉත්ථිං මාරෙසි.
iii. දාරිකා පීඨං නිසීදති.
iv. ත්වං විහාරං ගච්ඡථ.
v. චතුප්පදා වනං වසන්ති.

(ලකුණු 5+5+5

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2020

## Primary Piriven Year End Test - 2020

3 ශ්‍රේණිය / Grade 3

(සියලු ම හිමිකම් ඇවිරිණි)
(All Rights Reserved)

**පාලි** කාලය : පැය තුන යි

**Pali** **විභාග අංකය :-** …………….. Time : Three hours

**I** කොටසට ද, **II** කොටසින් 02, 03 ප්‍රශ්න ද ඇතුළත් වන පරිදි ප්‍රශ්න **පහකට (05) පමණක්** පිළිතුරු සපයන්න.

---

### I කොටස

**01.** කෙටි පිළිතුරු සපයන්න.

- i. පාලි වර්ණමාලාවේ ප්‍රධාන **ප්‍රභේද දෙක** හැඳින්වෙන බාලාවතාර සූත්‍ර ලියා දක්වන්න.
- ii. **චතුත්ථී** හා **සත්තමී** විභක්ති යෙදෙන **අර්ථ** 2 ලියා උදාහරණය බැගින් ලියන්න.
- iii. **සත්‍ථු, පිතු, මාතු, මන** යන ශබ්දවල තතියා විභක්ති බහුවචනය ලියා දක්වන්න.
- iv. සර්වනාම ශබ්ද හතරක් ලියන්න.
- v. **මාතුයා, මයි, හො, තෙසු** යන පදවල සිංහල තේරුම ලියන්න.
- vi. **අප්‍රත්‍යක්ෂ අතීත** හා **ආශීර්වාද** අර්ථ යෙදෙන ආඛ්‍යාත විභක්ති නම් කරන්න.
- vii. **සහසා, සුවෙ, හීයො, සන්තිකං** යන නිපාත පදයන්හි තේරුම ලියන්න.
- viii. **මේ විහාරයෙහි එක් භික්ෂුවක් වාසය කරයි** යන වාක්‍ය පාලියට නගන්න.
- ix. පාලි ව්‍යාකරණයේ සන්ධි කිරීම සඳහා යොදගන්නා සන්ධි විධි කීයද? ඒවා කවරේද?.
- x. **පක්ඛිපිත්වා, පටිග්ගහිතං, තත්ථාහං, දණ්ඩනීයො** යන පදවල තේරුම් ලියන්න.

*(ලකුණු 04 × 10 = 40 යි)*

### II කොටස

**02.** (අ) පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

සො මන්තං සුත්වා කුජ්ඣිත්වා තං මාරෙතුකාමො අනුබන්ධි. තං දිස්වා අහිගුණ්ඨිකො වෙගෙන පලායන්තො එකස්මිං පාසාණෙ පක්ඛලිත්වා පතමානො පුබ්බේ වුත්තපරිභාසවචනපරිචයෙන 'නමො බුද්ධාය'' ති වදන්තො පති. තස්ස තං වචනං අනුබන්ධන්තස්ස නාගරඤ්ඤො සොතපථෙ අමතං විය පති.

*(ලකුණු 05 යි)*

(ආ) පහත සඳහන් පද සුදුසු පරිදි ගලපා අර්ථවත් වාක්‍ය තනන්න.

- i. කති/ ආවුසො/ත්වං/වස්සො'සි
- ii. මනුස්සෙ/රක්ඛන්ති/දෙවා/නිච්චමෙව
- iii. නානාවිධානි/කරොති/දාරුභණ්ඩානි/වඩ්ඪකී/
- iv. සොපාණං/ ගණ්හිතුං/ආරුහති/ දාරකො/ඡත්තං
- v. පස්සිත්වා/ලභාම/මයං/රූපානි/ලොචනෙහි/ච/දුක්ඛං/ච/සුඛං

*(ලකුණු 05 යි)*

(ඉ) පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න.

- i. ඔහු නගරයට යන්නේ හඬයි.
- ii. දැරිය වනයට ගියාය.
- iii. අපි දුවන මිනිස්සු බලමු.
- iv. ළමයා සිනාසෙමින් ගෙදර ගියේය.
- v. වෙළෙන්දා බඩු විකුණමින් ගම්වල ඇවිදියි .

*(ලකුණු 05 යි)*

**03.** (අ) පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

එකස්මිං කිර ගාමෙ චත්තාරො මාණවකා සිප්පං උග්ගණ්හිතුං එකස්ස ආචරියස්ස සන්තිකං අගමංසු. තෙසු එකො වෙජ්ජසත්ථඤ්ච එකො ජොතිසසත්ථඤ්ච උග්ගණ්හි. එකො පන ගීතකලාසු අතීව පියො අහොසි. තස්මා සො ගීතසත්ථං උග්ගණ්හිතුමාරභි. ඉතරො වාදප්පියො වාචා නිපුණො හොති. තෙන සො තක්කසත්ථං පරියාපුණි. තෙ තෙසු තෙසු සිප්පෙසු කොටිප්පත්තා විය මඤ්ඤමානා අහෙසුං. තෙ සත්ථනිපුණා සමානාපි ලොකවොහාරං න ජානන්ති. තෙසු එවං ගච්ඡන්තෙසු දිවාභොජනවෙලා ච උපාගමි. තෙසං සන්තිකෙ තණ්ඩුලං අත්ථි. තස්මා තං පචිත්වා භුඤ්ජිතුං එකස්ස රුක්ඛමූලස්ස සන්තිකෙ නිවත්තිංසු.

(ලකුණු 07 යි)

(ආ) පහත ගාථා සම්පූර්ණ කර ලියන්න.

i. බුද්ධානුස්සති මෙත්තා ච -------------------------
ii. අත්තූපමාය සබ්බෙසං ----------------------------
iii. ඉමම්හි ගාමක්ඛෙත්තම්හි -------------------------
iv. ඊසකං අනිවත්තනතං ----------------------------

(ලකුණු 08 යි)

**04.** (අ) ආදේස, ආගම, ද්විත්ව යන සන්ධි විධි තුනට නිදසුන් තුනක් සපයන්න.

(ආ) පරස්වර ලෝපය හා රිකාරාදේශය දැක්වෙන බාලාවතාර සූත්‍රය ලියා නිදසුන් එක බැගින් ලියන්න.

(ඉ) **ක්වචාසවණ්ණං ලුත්තෙ, පරද්වෙභාවො ඨානෙ, මදාසරෙ, පරො වා සරො** යන සූත්‍රකාර්ය දක්වා උදාහරණය බැගින් සපයන්න.

(ලකුණු 03 + 04 + 08 = 15 යි)

**05.** (අ) පහත දැක්වෙන පදයන්හි ශබ්ද ප්‍රකෘතිය ලියන්න.

i. තාය ii.මනසා iii.එසො iv. තම්හා v. පිතරි vi. සත්ථාරා

(ආ) ඡිද ධාතුව සත්තමී ආඛ්‍යාත පරස්ස පදයේ වරනගා වගුගත කර දක්වන්න.

(ඉ) සමාස ප්‍රභේද කීයද? ඒවා මොනවාදැයි ලියන්න.

(ලකුණු 03 + 06 + 06 = 15 යි)

**06.** (අ) පහත සඳහන් වාක්‍යය දී ඇති සුදුසු නිපාත පද යොදා සම්පූර්ණ කරන්න.
(අභිණ්හං, සචෙ, පුරා, ආරකා, මා, උපරි, තථා, ආවුසො, කුහිං, සහසා)

i. …………….. මං අපාදකො හිංසි.
ii. කුමාරි ………. පාසාදෙ තිට්ඨති.
iii. …………….. කති වස්සො'සි ත්වං?
iv. යථා මාතා වදති …………….. අහං කරිස්සාමි.
v. සො ……………..අගච්ඡි.
vi. …………….. ත්වං නහායිස්සසි, අහම්පි නහායිස්සාමි.
vii. …………….. තව භාතා?
viii. ……………..බොධිසත්තො බාරාණසියං උප්පජ්ජි.
ix. පාපමිත්තො ……………..පරිවජ්ජෙය්‍ය.
x. තුම්හෙහි …………….. පච්චවෙක්ඛිතබ්බං.

(ආ) පහත දැක්වෙන වාක්‍ය අතීත කාලයට හරවා ලියන්න.

i. වරාහා භූමිං ඛණන්ති.
ii. ත්වං බුද්ධං වන්දසි.
iii. සමණො අස්සමෙ නිසීදති.
iv. අධිපති භත්තං භුඤ්ජති.
v. චොරො මණිං චොරෙති.

*(ලකුණු 10 + 05 = 15 යි)*

***

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

**දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන ශාඛාව**
அறநெறிப் பள்ளிகள், பிரிவேனாக்கள் மற்றும் பிக்கு கல்வி மாநில அமைச்சகம் - பிரிவேனா கல்விக் கிளை
State Ministry of Dhamma Schools, Pirivenas and Bhikku Education – Piriven Educational Branch

**වර්ෂාවසාන පරීක්ෂණය - 2021 (2022)**
**ஆண்டிறுதிப் பரீட்சை - 2021 (2022)**
Year End Term Test – 2021 (2022)

පැය දෙකයි

**පාලි** **3 වසර**

❖ I කොටසට ද II කොටසින් 2 , 3 ප්‍රශ්න ද ඇතුළත් වන පරිදි ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

01. කෙටි පිළිතුරු සපයන්න.

(i) අල්පප්‍රාණාක්ෂර සහ මහාප්‍රාණාක්ෂර හැඳින්වීමට යොදන නම් මොනවා ද?
(ii) "සත්‍ථු" ශබ්දය හා සමානව වරනැඟෙන තවත් ශබ්ද හතරක් ලියන්න.
(iii) අලිංගික "අම්හ" ශබ්දයෙහි චතුත්‍ථී විභක්ති රූප ලියා දක්වන්න.
(iv) පඨමා හා පඤ්චමී නාම විභක්ති යෙදෙන අර්ථ දෙකක් දක්වා උදාහරණ බැගින් ලියන්න.
(v) එතෙසු , තෙන , මයං , ඉමෙ යන සර්වනාම පදවල විභක්තිය ලියා දක්වන්න.
(vi) අතීතකාලය හැඟවෙන ආඛ්‍යාත විභක්ති කීයද? ඒවා නම් කරන්න.
(vii) අණ කිරීම හා ආශිර්වාදය යෙදෙන ආඛ්‍යාත විභක්තිය ලියා දක්වන්න.
(viii) පාලි නාමපද හා ආඛ්‍යාත පද සාදා ගන්නා අයුරු කෙටියෙන් පහදන්න.
(ix) සමාස ප්‍රභේද හතරක් ලියා දක්වන්න.
(x) අපච්චත්‍ථ තද්ධිතයට අයත් ප්‍රත්‍ය හතරක් ලියා දක්වන්න.

(ලකුණු 4 × 10 = 40)

## II කොටස

02. (අ) පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

එකස්මිං කිර ගාමෙ චත්තාරො මාණවකා සිප්පං උග්ගණ්හිතුං එකස්ස ආචරියස්ස සන්තිකං අගමංසු. තෙසු එකො වෙජ්ජසත්‍ථඤ්ච එකො ජොතිසත්‍ථඤ්ච උග්ගණ්හි. එකො පන ගීතකලාසු අතීව පියො අහොසි. තස්මා සො ගීතසත්‍ථං උග්ගණ්හිතුමාරභි.

(ලකුණු 05)

(ආ) පහත සඳහන් පද සුදුසු පරිදි ගළපා අර්ථවත් වාක්‍ය නිර්මාණය කරන්න.

(i) කථං / අසුද්ධජලං / මයං / ජානෙම
(ii) සිප්පං / දහරකාලෙ / උග්ගණ්හිතුං / කිඤ්චි / වායමි / න / සො
(iii) තායො / පුත්තෙහි / අගමිංසු / ඉත්‍ථියො / පණ්ණසාලං
(iv) විදිත්වා / ඉති / පබ්බජි / සම්බාධොයං / සො / ඝරවාසො
(v) ගගනයානෙන / තෙන / ගන්තුං / පිතරො / ඉච්ඡන්ති / තුම්හෙහි / සද්ධිං / අම්හාකං / ජම්බුදීපං

(ලකුණු 05)

(ඉ) පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න.

(i) පියා පුතා සමඟ ගමට ගියේය.

(ii) ඔහු ගෙදර ගොස් ආහාර අනුභව කරයි.

(iii) සිවුපාවෝ වනයේ වාසය කරති.

(iv) ළමයා හෙට පාසලට නොයන්නේ ය.

(v) නුඹලා පින් කරහු.

(ලකුණු 05)

03. (අ) පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

සත්ථා තස්ස උපනිස්සයං දිස්වා පිණ්ඩාය චරන්තො තං ගෙහද්වාරං අගමාසි. අථස්ස මාතාපිතරො සත්ථාරං අන්තො පවෙසෙත්වා සක්කච්චං පරිවිසිංසු , සත්ථා භත්තකිච්චාවසානෙ කහං අනිත්ථිගන්ධකුමාරො'ති පුච්ඡි. එසො භන්තෙ අහාරූපච්ඡෙදං කත්වා අන්තොගබ්භෙ නිසින්නො'ති. පක්කොසථ නත්ති. සො ආගන්ත්වා සත්ථාරං වන්දිත්වා එකමන්තං නිසීදි.

(ලකුණු 07)

(ආ) පහත ගාථා සම්පූර්ණ කරන්න.

(i) සම්මාගතො සුභං ඨානං .............................

(ii) තථා ඉත්ථිපුමා චෙව ................................

(iii) මහා සම්පත්ති සම්පත්තා ................................

(iv) ජාතිජරා ව්‍යාධිචුති අපායා ................................

(ලකුණු 08)

04. (අ) සන්ධි වලින් ලැබෙන ප්‍රයෝජන තුනක් ලියන්න.

(ආ) පහත සන්ධි පද විසන්ධි කරන්න.

(i) පනමෙ (ii) ඣායාව (iii) නොපෙති (iv) වනෝදයො

(v) අබ්භුග්ගතො (vi) ත්‍යජ්ජ (vii) තස්මාතිහ (viii) සාධූති

(ඉ) පාලි භාෂාවේ තද්ධිත ප්‍රභේද හතරක් නම් කරන්න.

(ඊ) පහත තද්ධිත පදවල ප්‍රත්‍ය වෙන් කරන්න.

(i) ධනවන්තු (ii) මනුස්සත්ත (iii) චතුත්ථ

(ලකුණු 4 + 4 + 4 + 3 = 15)

05. (අ) පහත දැක්වෙන පදයන්හි ශබ්ද ප්‍රකෘතිය ලියන්න.

(i) සත්ථරි (ii) තව (iii) මනසා

(iv) තස්සා (v) මයා (vi) ඉමානි

(ආ) පච (පාකෙ) ධාතුව අජ්ජතනී ආඛ්‍යාත පරස්සපදයේ වරනඟන්න.

(ඉ) පහත සඳහන් සමාසපදවල සමාස ප්‍රභේදය නම් කරන්න.

(i) අන්ධබධිරො (ii) ගීතවාදිතං (iii) චතුද්දිසා

(iv) ජිතින්ද්‍රියො (v) අනුරථං (vi) සරණගතො

(ලකුණු 3 + 6 + 6 = 15)

06. (අ) පහත සඳහන් නිපාත පද සුදුසු පරිදි යොදා වාක්‍ය නැවත ලියන්න.

**(මා , සාධුකං , නනු , ආරකා , යථා , සද්ධිං , න , නිච්චං , අභිණ්හං , සතතං , තථා)**

(i) ද්වෙ ඉමෙ භික්ඛවෙ අන්තා පබ්බජිතෙන ……………………………… සෙවිතබ්බා.

(ii) පබ්බජිතෙන …………………………… පච්චවෙක්ඛිතබ්බං.

(iii) කල්‍යාණියත්ථෙරො ……………………………… රාජගෙහෙ පරිභුඤ්ජති.

(iv) පිතා පුත්තෙන ……………………………… ගාමං ගච්ඡි.

(v) අහං ……………………………… තුම්හෙ රක්ඛාමි.

(vi) …………………………… මාතා වදති ……………………... අහං කරොමි.

(vii) පාපමිත්තො ………………………….. පරිවජ්ජෙය්‍ය.

(viii) …………………………….. සම්පත්තෙ කාලෙ වායමිතබ්බන්ති.

(ix) ……………………………… මනසි කරොථ.

(x) ……………………………… මං ආපදකො හිංසි.

(ආ) පහත දැක්වෙන වාක්‍ය අතීත කාලයට හරවා ලියන්න.

(i) දාරිකා පුප්ඵානි ඔචිනාති.

(ii) ථෙරා ධම්මං දෙසෙන්ති.

(iii) ත්වං නගරං ගච්ඡසි.

(iv) අහං පරිවෙණෙ උග්ගණ්හාමි.

(v) තුම්හෙ දානං දෙථ.

(ලකුණු 10 + 5 = 15)

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**වර්ෂාවසාන වාර පරීක්ෂණය - 2022 (2023)**
**ஆண்டிறுதிப் பரீட்சை - 2022 (2023)**
Year End Term Test – 2022 (2023)

පැය දෙකයි

**පාලි** විභාග අංකය : ............................................ **3 ශ්‍රේණිය**

❖ **I කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද, II කොටසේ 03 වන ප්‍රශ්නය ද ඇතුළු වන සේ ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

## I කොටස

01. කෙටි පිළිතුරු සපයන්න.

i. අල්පප්‍රාණාක්ෂර හා මහාප්‍රාණාක්ෂර හඳුන්වන සූත්‍ර දෙක ලියන්න.
ii. තතියා හා චතුත්ථී නාම විභක්ති දෙකේ අර්ථ ලියන්න.
iii. නපුංසක ලිංග **"මන"** ශබ්දය හා සමානව වරනැගෙන ශබ්ද හතරක් ලියන්න.
iv. **"ත, එත, ඉම, අමු"** යන සර්ව නාම ශබ්ද වල, පුල්ලිංගයෙහි පඤ්චමී විභක්ති ඒක වචන රූප ලියන්න.
v. සත්තමී ආඛ්‍යාත විභක්තියෙහි අර්ථ දෙක ලියා දක්වන්න.
vi. බාහිර සන්ධියට අදාළ සන්ධි ප්‍රභේද හතර ලියන්න.
vii. අසවර්ණාදේශ සන්ධියට උදාහරණ හතරක් ලියන්න.
viii. සාමඤ්ඤ තද්ධිතයෙහි ප්‍රභේද හතර ලියා දක්වන්න.
ix. තුමන්ත ක්‍රියා පද හතරක් ලියන්න.
x. බහුබ්බීහි සමාසයට උදාහරණ හතරක් ලියන්න.

(ලකුණු $4 \times 10 = 40$)

## II කොටස

02. (අ) පහත ඡේදය සිංහලට නගන්න.

සීහලදීපෙ කල්‍යාණතිස්සො නාම රාජා ඉස්සරියං පවත්තෙති. තස්ස උත්තියො නාම කනිට්ඨො උපරාජා අහොසි. සො කල්‍යාණියත්ථෙරස්ස සන්තිකෙ සිප්පං සික්ඛි. තතො සො රඤ්ඤො අග්ගමහෙසියා සද්ධිං විස්සාසං අකාසි. රාජා තං ඤත්වා ගණ්හථේතන්ති අමච්චෙ ආණාපෙසි.

(ලකුණු 05)

(ආ) පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න.

i. කන්‍යාව ගොයාට පහර දුන්නාය.
ii. යම්සේ මව කියයි ද මම එසේ කරමි.
iii. ශිෂ්‍යයෝ ගුරුවරයාගේ අවවාදය පිළිගත්හ.
iv. ඔහු ත්‍රිපිටක බුද්ධ වචනය ඉගෙන ගනියි.
v. උපාසකයා පන්සිල් රකියි.

(ලකුණු 05)

(ඉ) පහත සඳහන් වාක්‍ය සිංහලට නගන්න.

i. පුරිසො තිණ්හඵරසුනා රුක්ඛං ඡින්දති.
ii. අයං සීහො එකං ඉත්ථිං මාරෙති.
iii. පිතා පුත්තෙන සද්ධිං ගෙහං අගච්ඡි.
iv. අහං සතතං තුම්හෙ රක්ඛාමි.
v. වඩ්ඪකී නානාවිධානි දාරුභණ්ඩානි කරොන්ති.

(ලකුණු 05)

03. (අ) පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

සො කිරෙකො මිච්ඡාදිට්ඨිකො එකදිවසං නදීතීරං ගන්ත්වා ඛෙත්තං සොධෙති, තස්ස උපනිස්සයසම්පත්තිං දිස්වා තස්ස සන්තිකං අගමාසි. සො සත්ථාරං දිස්වා'පි සාමීචිකම්මං අකත්වාව තුණ්හී අහොසි. අථ නං සත්ථා පුරෙතරං ආලපිත්වා බ්‍රාහ්මණ කිං කරොසී'ති ආහ. ඛෙත්තං භො ගොතම සොධෙමී'ති, සත්ථා එත්තකමෙව වත්වා තතො පුන දිවසෙ'පි තස්ස ඛෙත්තං කසිතුං ආගතස්ස සන්තිකං ගන්ත්වා බ්‍රාහ්මණ කිං කරොසී'ති පුච්ඡිත්වා ඛෙත්තං කසාමි භො ගොතමා'ති සුත්වා පක්කාමි. පුනදිවසාදීසු'පි තථෙව ගන්ත්වා, භො ගොතම ඛෙත්තං වපාමි නිදෙමි රක්ඛාමී'ති සුත්වා පක්කාමි.

(ලකුණු 06)

(ආ) පහත ගාථා සම්පූර්ණ කරන්න.

i. මහාසම්පත්ති සම්පත්තා..................
ii. ඊසකං අනිවත්තන්තං......................
iii. වණ්ණසණ්ඨානගන්ධෙහි.................

(ලකුණු 09)

04. (අ) පාලි භාෂාවේ සන්ධි විධි අට නම් කරන්න.

(ආ) පහත සන්ධි පද විසන්ධි කරන්න.

i. බව්හාබාධො
ii. පුනරාගච්ඡති

iii. සමෙතායසමා

iv. ඉච්චාදයො

v. අතීතො

vi. ඡළභිඤ්ඤා

vii. සුපපතිට්ඨිතො

(ලකුණු 8 + 7 = 15)

05. (අ) පහත සමාස පදවල සමාස ප්‍රභේදය නම් කරන්න.

i. ධම්මබුද්ධි

ii. පඤ්චසීලං

iii. ධම්මරතො

iv. පත්තචීවරං

v. ජීතින්ද්‍රියො

vi. උපනගරං

(ආ) චර ධාතුව **"පරොක්ඛා"** ආඛ්‍යාත පරස්සපදයේ වරනගන්න.

(ලකුණු 6 + 9 = 15)

06. (අ) පහත තද්ධිත පදවල ප්‍රත්‍යය වෙන්කර ලියන්න.

i. දයාලු

ii. චතුත්ථ

iii. ධනවන්තු

iv. ලහුතා

v. සබ්බදා

(ආ) කිතක ප්‍රභේද පහ ලියන්න.

(ඉ) ප්‍රශ්නවාචී නිපාත පද පහක් ලියන්න.

(ලකුණු 5 + 5 + 5 = 15)

07. (අ) උපසර්ග විස්ස පිළිවෙළින් ලියන්න.

(ආ) **"මා"** නිපාත යෝගයට උදාහරණ පහක් ලියන්න.

(ලකුණු 10 + 5 = 15)

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

02 | S

**අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**
**கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு**
**Ministry of Education – Division of Piriven Education**

**වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)**
**வருட இறுதிப் பரீட்சை – 2023 (2024)**
**Year End Test – 2023 (2024)**

පැය තුනයි

**(02) පාලි** **03 ශ්‍රේණිය**

- **සැලකිය යුතුයි.**
**I කොටසට** ද, **II කොටසින්** 02, 03 ප්‍රශ්න ද ඇතුළත් වන සේ **ප්‍රශ්න පහකට පමණක්** පිළිතුරු සපයන්න.

## I කොටස

01. කෙටි පිළිතුරු සපයන්න.

i. **'පාලි වර්ණ මාලාවේ හ්‍රස්ව හා දීර්ඝ '** හඳුන්වන බාලාවතාර සූත්‍ර පාඨ ලියා දක්වන්න.

ii. **'සම්ප්‍රදානාර්ථය, අපාදානාර්ථය'** යන අර්ථයන් හි යෙදෙන විභක්ති ලියන්න.

iii. **'ජෙතු'** ශබ්දයේ චතුත්ථී විභක්ති ඒක වචනය හා බහු වචනය ලියන්න.

iv. **ඉසි, අංගුලිං, බිලං, ආතුරාලයං, පතිං, අංකුසං, දාසො, ජලජං** යන වචන අකාරාදි පිළිවෙලට ලියන්න.

v. සාමඤ්ඤ තද්ධිතයේ කොටස් ලියා දක්වන්න.

vi. **'සරා සරෙ ලොපං'** යන සූත්‍රයේ අර්ථය දක්වා නිදසුනක් සපයන්න.

vii. **'සනිකං, සායං, තිරියං, උපරි '** යන නිපාත පදවල තේරුම ලියන්න.

viii. පාලි ව්‍යාකරණයේ දී සන්ධි කිරීම සඳහා යොදාගන්නා සන්ධි විධි කීයද? ඒවා ලියන්න.

ix. **උග්ගණ්හාති, පටිවසති, ඔනද්ධා, විහෙඨෙති '** යන පදවල උපසර්ග වෙන් කර දක්වන්න.

x. ආඛ්‍යාත විභක්ති ලියා දක්වන්න. (ලකුණු 4 × 10 = 40)

## II කොටස

02. අ) පහත සඳහන් ඡේදය **සිංහලට** නගන්න.

තෙ'පි සත්ථාරං දිස්වා වන්දිත්වා පක්කමිංසු, එකම්පි භික්ඛුං පූවං ගණ්හථා'ති න වදිංසු, සත්ථා තෙසං ගතකාලෙ භික්ඛු ආහ. බාදිස්සථ භික්ඛවෙ පූවෙ'ති, කහං භන්තෙ පූවා'ති, කිං න පස්සථ දාරකෙ පූවපච්ඡියො උක්ඛිපාපෙත්වා අතික්කන්තෙ'ති. භන්තෙ එවරූපා නාම දාරකා කස්සචි පූවං දෙන්තී'ති. භික්ඛවෙ කිඤ්චා'පි තෙ මං වා තුම්හෙ වා පූවෙහි න නිමන්තයිංසු පූවසාමිකො පන භික්ඛු පච්ඡතො ආගච්ඡති පූවෙ ඛාදිත්වා'ව ගන්තුං වට්ටතී'ති, බුද්ධානං හි එකපුග්ගලෙ'පි ඉස්සා පදොසො වා නත්ථි තස්මා ඉමං වත්වා භික්ඛුසංඝං ආදාය එකස්මිං හි රුක්ඛමූලෙ ඡායාය නිසීදි. දාරකා මහාකස්සපත්ථෙරං පච්ඡතො ආගච්ඡන්තං දිස්වා උප්පන්නසිනෙහා පීතිවෙගෙන පරිපුණ්ණසරීරා හුත්වා පච්ඡියො ඔතාරෙත්වා ථෙරං පඤ්චපතිට්ඨිතෙන වන්දිත්වා පූවෙ පච්ඡිහි සද්ධිං යෙව උක්ඛිපිත්වා ගණ්හථ භන්තෙ'ති ථෙරං වදිංසු. අථ නෙ ථෙරො ආහ. එස සත්ථා භික්ඛුසංඝං ගහෙත්වා රුක්ඛමූලෙ නිසින්නො තුම්හාකං දෙය්‍යධම්මං ආදාය ගන්ත්වා භික්ඛුසංඝස්ස සංවිභාගං කරොථා'ති. සාධු භන්තෙ'ති නිවත්තිත්වා ථෙරෙන සද්ධිං යෙව ගන්ත්වා පූවෙ දත්වා ඔලොකයමානා එකමන්තෙ ඨත්වා පරිභොගාවසෙන උදකං අදංසු.

(ලකුණු 9)

ආ) පහත සඳහන් ගාථා සම්පූර්ණ කරන්න.

i) අනන්තචිත්ථාරගුණං　　ii) සුඛී භවෙය්‍යං නිද්දුක්ඛො　　iii) විජ්ජුබුබ්බුලඋස්සාව

(ලකුණු 2 × 3 = 6)

03. අ) පහත සඳහන් ඡේදය **සිංහලට** නගන්න.

එකස්මිං කිර ගාමෙ චත්තාරො මාණවකා සිප්පං උග්ගණ්හිතුං එකස්ස ආචරියස්ස සන්තිකං අගමංසු. තෙසු එකො වෙජ්ජසත්ථඤ්ච එකො ජොතිසත්ථඤ්ච උග්ගණ්හි. එකො පන ගීතකලාසු අතීව පියො අහොසි. තස්මා සො ගීතසත්ථං උග්ගණ්හිතුමාරභි. ඉතරො වාදප්පියො වාචා නිපුණො හොති. තෙන සො තක්කසත්ථං පරියාපුණි. තෙ චත්තාරො'පි ජනා වත්තපටිවත්තෙහි ආචරියං ආරාධෙන්තො අත්තනො අත්තනො සත්ථෙසු සමත්ථා හුත්වා න චිරෙනෙ'ව සිප්පුග්ගහණං නිට්ඨපෙසුං. තතො ගුරුපූජං ච කත්වා සකගෙහං ගන්තුකාමො ආචරියං වන්දිත්වා මග්ගං පටිපජ්ජිංසු. තෙ තෙසු තෙසු සිප්පෙසු කොටිප්පත්තා විය මඤ්ඤමානා අහෙසුං. අපි ච, තෙ සත්ථනිපුණා බුද්ධිමන්තා සමානාපි ලොකවොහාරං අජානනතාය අතිධාවනතාය ච කිච්චා'කිච්චෙසු පමාණකාරිනො න අහෙසුං.

(ලකුණු 5)

ආ) පහත සඳහන් වාක්‍ය **පාලියට** නගන්න.

i) මම දිනපතා විහාරයට යමි.

ii) පෙර දඹදිව චණ්ඩාශෝක නම් රජෙක් වීලු.

iii) රජ ධාර්මික වේවා.

iv) අසවල් නගරයේ දරුණු මිනිසුන් ජීවත් වෙති.

v) දැන් අපි ධර්මය ද විනය ද සංගායනා කරන්නේ නම් මැනවි. (ලකුණු 5)

ඉ) පහත සඳහන් වාක්‍ය **සිංහලට** නගන්න.

i) භවන්තො මම වචනං සුණන්තු.

ii) අථ නාගරාජා තස්ස තානි පුප්ඵානි දත්වා එවමාහ.

iii) අස්ස අක්ඛිනො අස්සුනි පග්ඝරති.

iv) ත්වං ඉදානි ඉතො ගන්ත්වා සුවෙ දිවා ඉධ ආගච්ඡ.

v) යො පමාදො සො මච්චුනො සදිසො. (ලකුණු 5)

04. අ) බාහිර සන්ධිය යනු කුමක් දැයි හඳුන්වා එහි ප්‍රභේද ලියා දක්වන්න. (ලකුණු 5)

ආ) පහත සඳහන් සන්ධි පද විසන්ධි කරන්න.

i) ධනම්මත්ථි　　ii) ත්‍යාහං

iii) උපෙතං　　iv) ඡායාව

v) සාධූති　　vi) සද්ධීධ

vii) අත්තදත්ථං　　viii) අප්පමාදො

ix) ජානෙමුතං　　x) ඉතොනායති (ලකුණු 5)

ඉ) පහත සඳහන් පදවල විභක්ති නම් කරන්න.

i) න මෙ **<u>භන්තෙ</u>** ඛමනීයං.

ii) මාතා **<u>දාරකෙන</u>** සහ සල්ලපති.

iii) ආචරියො **<u>සිස්සානං</u>** සිප්පං දෙති.

iv) මන්තිනො **<u>ගාමෙසු</u>** චරන්ති.

v) මිගො **<u>සීහම්හා</u>** භායති.

(ලකුණු 5)

05. අ) සමාස යනු කුමක් දැයි හඳුන්වා ඉන් ලැබෙන ප්‍රයෝජන 4 ක් ලියන්න.

(ලකුණු 5)

ආ) පහත සඳහන් සමාස පද කුමන සමාසයට අයත් දැයි නම් කරන්න.

i) ධම්මබුද්ධි ii) රාජභයං

iii) අන්ධබධිරො iv) තිභවං

v) ජීතින්ද්‍රියො vi) අනුරථං

vii) පත්තචීවරං viii) බහුතාපසො

ix) යාවජීවං x) මාතාපිතරො

(ලකුණු 5)

ඉ) පහත සඳහන් පදවල කිතක ප්‍රත්‍යය වෙන් කරන්න

i) හුත ii) පස්සන්ත iii) කරිස්සං iv) භුත්තාවි v) රොදන්ත

(ලකුණු 5)

06. අ ) තද්ධිත යන්න හඳුන්වා ප්‍රධාන ප්‍රභේද නම් කරන්න.

(ලකුණු 5)

ආ) පහත සඳහන් පදවල තද්ධිත ප්‍රත්‍යය වෙන් කරන්න.

i) ලහුතා ii) වාචාල

iii) සාකටික iv) මොග්ගල්ලායන

v) සබ්බදා vi) සතිමන්තු

vii) පාපතම viii) ජනතා

ix) මාණව x) ඉදානි

(ලකුණු 5)

ඉ) පහත සඳහන් ඡේදයෙහි ඇති පූර්ව ක්‍රියා පද තෝරා ලියන්න.

සො කුමාරො පතිදිනං අත්තනො මිත්තෙහි සද්ධිං පාඨසාලං ගන්ත්වා සාධුකං උග්ගණ්හිත්වා ගෙහං ආගච්ඡති. අථ සො සායං අත්තනො මිත්තස්ස ගෙහෙ කීළිත්වාන ආපණං ගච්ඡති. තථා සො කුමාරො අනුදිනං බුද්ධං වන්දිත්වා පොත්ථකානි පඨිත්වා අත්තනො මාතුයා සහ සල්ලපන්තො සයති.

(ලකුණු 5)

07. අ) **'නෙතු'** ශබ්දය සියලු විභක්තිවල වරනගන්න (වගු අනිවාර්යයි)

(ලකුණු 5)

ආ) **'ලිඛ'** ධාතුව භවිස්සන්ති ආඛ්‍යාත පරස්ස පදයෙහි වරනගන්න. (වගු අනිවාර්යයි)

(ලකුණු 5)

ඉ) පහත සඳහන් වාක්‍ය අතීත කාලයට හරවා ලියන්න.

i) සො විහාරං ගන්ත්වා බුද්ධං වන්දති.

ii) උපාසකා ධම්මං සුණන්ති.

iii) ත්වං අක්ඛරං ලිඛසි.

iv) මයං සතතං සච්චං භාසාම.

v) තුම්හෙ පුඤ්ඤානි කරොථ.

(ලකුණු 5)